ප්‍රසම්පාදන දැන්වීමයි

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

(කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය)

2026/2027 වර්ෂය සඳහා
ආරක්ෂක සේවා සැපයුම් ආයතනයක් තෝරා ගැනීම සඳහා ලංසු කැඳවීමයි

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) පහත සඳහන් ස්ථාන/කාර්යාල වෙනුවෙන් ආරක්ෂාව ලබාදීම සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි පිළිගත් ආරක්ෂක සේවා ආයතන වෙතින් මුදු, තැබූ මිලගණන් කැඳවනු ලැබේ.

ලංසු අංක	: T/15/2026
ලංසු නාමය	: 2026/2027 වර්ෂය සඳහා ආරක්ෂක සේවා සැපයුම් ආයතනයක් තෝරා ගැනීම සඳහා ලංසු කැඳවීමයි
ලංසු ලේඛන ගාස්තුව	: Rs.12,500.00 (ආපසු නොගෙවන)
ලංසු තැබීමේ අවසන් දිනය සහ වේලාව	: 2026/11/25 පෙ.ව.11:30 ට
ලංසු තැබීමට පෙර රැස්වීම (Prebid)	: 2026/11/17 පෙ.ව.10:00 ට – අධ්‍යක්ෂ මණ්ඩලයීය රැස්වීම් ශාලාව, IDB ප්‍රධාන කාර්යාලය, කටුබැද්ද
ලංසු ආරක්ෂණ මුදල	: 900,000.00 (සියලුම ලංසු සමඟ ලංසු ඇපයක් ඉදිරිපත් කළ යුතුය)
ලංසු ආරක්ෂණ වලංගු දිනය	: 2027.03.24

01. ආරක්ෂක සේවාවන් අවශ්‍ය ස්ථාන

1. **ප්‍රධාන කාර්යාලය - කටුබැද්ද**
2. **සම්භාණ්ඩ සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය - කටුබැද්ද**
3. **සිලෝන් ප්ලාසා - කටුබැද්ද**
4. CERA - **කටුබැද්ද**
5. **රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය සහ විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය - පැලියගොඩ**
6. **යෝග්‍ය තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - පන්නල**
7. **කාර්මික ජනපදය - ඒකල**
8. **කාර්මික ජනපදය - හොරණ**
9. **කාර්මික ජනපදය - පානළුව - හෝමාගම**
10. **කාර්මික ජනපදය - පල්ලෙකැලේ**
11. **කාර්මික ජනපදය - කළුදෑවල - මාතලේ**
12. **කාර්මික ජනපදය - කොටගල**
13. **කාර්මික ජනපදය - වවුනියාව**
14. **කාර්මික ජනපදය - ගලිගමුව - කෑගල්ල**
15. **කාර්මික ජනපදය - අච්චුවේලි**
16. **කාර්මික ජනපදය - ඇල්පිටිය**
17. **කාර්මික ජනපදය - පන්නල**
18. **දිස්ත්‍රික් කාර්යාලය හා පොදු සේවා මධ්‍යස්ථානය - මාතර**
19. **දිස්ත්‍රික් කාර්යාලය - මොණරාගල**
20. **දිස්ත්‍රික් කාර්යාලය - හම්බන්තොට**
21. **දිස්ත්‍රික් කාර්යාලය - බදුල්ල**
22. **දිස්ත්‍රික් කාර්යාලය ගාල්ල සහ සිලෝන් ප්ලාසා**
23. **සම් පුහුණු මධ්‍යස්ථානය - ඉමියංගොඩ**
24. **දිස්ත්‍රික් කාර්යාලය - අනුරාධපුර**

ඉහත ස්ථාන සඳහා ආරක්ෂක නිලධාරීන් 80 ක් පමණ යෙදවිය යුතු වනු ඇත.

02. ලංසු තැබීමේ ක්‍රියාවලිය, ජාතික තරගකාරී ලංසු තැබීමේ ක්‍රියා පරිපාටිය (NCB) ඔස්සේ සිදු කෙරෙනු ඇත.

03. උනන්දුවක් දක්වන හා සුදුසුකම් ලත් ලංසුකරුවන්ට, මොරටුව, කටුබැද්ද, ගාලු පාරේ අංක 615 දරන ස්ථානයේ පිහිටි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සැපයුම් අංශයේ, සහකාර අධ්‍යක්ෂ (සැපයුම්) වෙතින් වැඩිදුර තොරතුරු ලබා ගත හැකි අතර, 2026/11/04 සිට 2026/11/24 දක්වා රජයේ කාර්යාල දිනවල උදෑසන 09.00 සිට පස්වරු 03.00 දක්වා කාලය තුළ ලංසු ලේඛන පරීක්ෂා කළ හැක. තවද, මෙම ලංසු ලේඛන IDB ආයතනයේ වෙබ් අඩවියෙන් (www.idb.gov.lk) සහ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් (www.industry.gov.lk) ද (පරීක්ෂා කිරීමේ අරමුණින් පමණක්) දැක බලා ගත හැකිය.

එහෙත්, ලංසු ඉදිරිපත් කිරීමේදී, ඉහත සඳහන් කාර්යාලයෙන් මිලදී ගන්නා ලද ලංසු ලේඛනයන් පමණක් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා 011-2607004 (සහකාර අධ්‍යක්ෂ – සැපයුම්), 011-2605434 (අධ්‍යක්ෂ – පරිපාලන) හෝ 011-2605326, 7 (IDB ප්‍රධාන දුරකථන අංක) ඔස්සේ සම්බන්ධ විය හැක.

04. ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් (මුල් පිටපත සහ අනු පිටපත යන දෙකම), මොරටුව, කටුබැද්දේ පිහිටි IDB ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයේ සහකාර අධ්‍යක්ෂ වෙතින්, 2026/11/04 සිට 2026/11/24 දක්වා (රජයේ කාර්යාල දිනවල) උදෑසන 09.00 සිට පස්වරු 03.00 දක්වා කාලය තුළ ලබා ගත හැක.

4.1 ලංසුකරුවෙකු ලංසු ලේඛන මිලදී ගැනීමට පැමිණෙන විට, සමාගමේ නම, සමාගමේ ලියාපදිංචි අංකය, ලංසු අංකය සහ ලංසුවේ නම ඇතුළත් කර, "සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (විශාල)" වෙත යොමු කරන ලද "ආයතනයේ ඉල්ලීම් ලිපියක්" (Company Request Letter) ඉදිරිපත් කළ යුතුය.

සහ

4.2 ලංසු ලේඛන ලබා ගැනීමට පෙර, ඉහත සඳහන් ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තුව ගෙවිය යුතුය. මෙම ගෙවීම සිදු කළ යුත්තේ මුදලින් (Cash) පමණි.

05. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන (මුල් පිටපත සහ අනු පිටපත සහිතව), කටුබැද්දේ පිහිටි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) ප්‍රධාන කාර්යාලයේ, සභාපති කාර්යාලය ඉදිරිපිට ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. එසේ නොමැති නම්, ඉහත සඳහන් කර ඇති වේලාවට හෝ ඊට පෙර, "සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (විශාල), ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව" යන ලිපිනයට ලියාපදිංචි තපැලෙන් හෝ කුරියර් සේවාවක් මගින් යොමු කළ යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම, සහභාගිවීමට කැමති ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී IDB ප්‍රධාන කාර්යාලයේ පිහිටි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුව අඩංගු කවරයේ ඉහළ වම් කෙළවරේ ලංසු අංකය සහ ලංසු නාමය සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු පත්, ලංසු ඇපකර රහිත ලංසු පත් හා තිල මුදු, රහිත ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (විශාල),
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව.
දුරකථන/ ෆැක්ස් : 011-2607004